# බස්නාහිර පළාතේ, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය

**(මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන සහ වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය බස්නාහිර පළාත)**

# දැන්වීමයි

මාර්ග සහ මාර්ග ආශ්‍රිත ඉදිකිරීම් වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම තුළින්, මහජනතාවගේ ප්‍රවාහන කාලය අවම කර, සුව පහසු සහ ආරක්ෂිත මාර්ග පද්ධතියක් උරුමකර දීම මගින්, ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කර, පළාත් අතර සම්පත් බෙදී යාමේ විෂමතාවය අවම කිරීමේ අරමුණ පෙරදැරිව මෙම අධිකාරිය පිහිටුවා ඇත. ඒ අනුව, මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට අදාළ වන පහත තනතුරු ඇබෑර්තු සඳහා බස්නාහිර පළාත තුළ වර්ෂ 03 ක ස්ථිර පදිංචිය සහිත, ක්‍රියාශීලී සහ ස්වයං උද්යෝගී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. සහකාර කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්)

**සුදුසුකම් (අනිවාර්ය පොදු සුදුසුකම්)**

**බාහිර අයදුම්කරුවන්**

රාජ්‍ය පරිපාලනය / මානව සම්පත් කළමනාකරණය / වාණිජ්‍ය හා ගිණුම් / නීතිය / සමාජ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත i හෝ ii)**

i. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

ii. 'කනිෂ්ඨ කළමනාකාර' සේවා ශ්‍රේණියෙහි I ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප** : කළමනාකරණ සේවා චක්‍රලේඛ 2/2016 අනුව
MM 1-3 : රු. 55,925 - 10 x 1,375 - 15 x 1,910 - 98,325

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**පත්වීමේ ස්වභාවය :** ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සඳහා හිමිකම් සහිතයි.

**අමතර ප්‍රතිලාභ** :
- ❖ රජයේ අනුමත අනෙකුත් දීමනා
- ❖ රජයේ අනුමත ජීවන වියදම් දීමනාව
- ❖ වාහන / නිවාස / ආපදා ණය පහසුකම්
- ❖ වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

**අයදුම් කිරීම :**

01. ජීව දත්ත තොරතුරු සමග ඥාතීන් නොවන, තමන් පිළිබඳව නිර්දේශ කළ හැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්, අධ්‍යාපනික / වෘත්තිමය සුදුසුකම් සනාථ කිරීම සඳහා ඒ හා සම්බන්ධ සහතික පිටපත් සහිතව, අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේම, දැනටමත් රජයේ / සංස්ථාවන්හි / ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි සේවයේ නියුතු අය, ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ තම ආයතන ප්‍රධානීන් මාර්ගයෙනි.

02. අයදුම්පත බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි, අදාළ තනතුරු නාමය සඳහන් කළ යුතුය.

03. සියලු අයදුම්පත් 2021.05.20 දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**බස්නාහිර පළාතේ, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය,**
**අංක 59, ශාන්ත සෙබස්තියන් කන්ද, කොළඹ 12.**
**දුරකථනය - 011-2321990**